**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

**සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**சமூக வலுவூட்டல் அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DDD/HO/3/ACC/14/Deli/2017 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................................ | දිනය<br>திகதி<br>Date 2018.06.19 |

සියළුම ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය ලේකම්,
සමෘද්ධි මුලස්ථාන කළමණාකරු/ කලාප කළමණාකරු/ මහා සංගම් කළමණාකරු
සමෘද්ධි සංවර්ධන නිලධාරින්,

<u>සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබන පවුලක් තේරීමේ හා ක්‍රියාත්මක කිරිමේ ක්‍රමවේදය</u>

සමස්ථ දිවයිනම ආවරනය වන පරිදි නව සමෘද්ධි ප්‍රතිලාභි පවුල් 150,000 සඳහා සමෘද්ධි සහනාධාර ලබාදීමට මේ වන විටත් කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිවී තිබේ.

02. ඒ අනුව සමෘද්ධි සහනාධාර අයදුම් කිරිමේ ආදර්ශ ඉල්ලුම්පත, ඉල්ලුම්පත්‍රිකාවට ඇතුලත්විය යුතු කරුණු ආදි අදාල තොරතුරු මෘද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් මේ වන විටත් ප්‍රකාශයට පත්කර ඇත.

03. තවද මේ වන විටත් දැනුවත්වී ඇති ජන කොටස් ( පුද්ගලයින් , මහජන නියෝජිතයින් , සිවිල් සංවිධාන ආදි ) වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරින්, කලාප මට්ටමේ නිළධාරින් වෙත ඉල්ලුම්පත් යොමුකරන බවටද කරුණු වාර්තා වි ඇත.

04. එලෙස කිසියම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් මගින් ලබාදෙන ඉල්ලුම්පත්‍ර එක් එක් ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සෘජු අධික්ෂණය යටතේ මුලස්ථාන කළමණාකරුවන් භාරයේ සුරැකිව තබාගත යුතු අතර එකී අයදුම්පත් භාර ගත් බවට ඉල්ලුම් කරුවන් වෙත අවශ්‍ය වන්නේනම් කුවිතාන්සිපත් නිකුත් කල යුතුවේ.

05. පළමු වාරයේ ඉල්ලුම්පත්‍ර කැඳවීමේ දිනය 2018 ජුලි 31 දිනෙන් අවසන්වීමට නියමිත අතර මෙලෙස ඔබ සතු ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාකලයුතු ආකාරය පිළිබඳව සියළු උපදෙස් ඇතුලත් සවිස්තරාත්මක චක්‍රලේඛ නොබෝ දිනකින් ඔබ වෙත ලබා දීමට කටයුතු කරනු ඇත. එතෙක් මෙම ලිපියෙන් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ . දඩල්ලගේ
අධ්‍යක්ෂ ජනරාල්


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |